# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2353/55 - 2023 ඔක්තෝබර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2023.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/81 (XII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23ද වගන්තිය යටතේ වන නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ද වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පරිසර අමාත්‍ය, නසීර් අහමඩ් වන මා විසින්, මේ නියමය මගින්, 2023 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි-

(*අ*) ජලය ගබඩා කිරීමේ කාර්යය සඳහා භාවිතා කිරීම පිණිස වර්ණ ගැන්වූ පොලිඑතිලීන් ටෙරප්තලේට්වලින් (PET) බෝතල් නිෂ්පාදනය කිරීම;

(*ආ*) බෝතල් ලේබල් කිරීම සඳහා පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) භාවිතය; සහ

(*ඇ*) බෝතල් සඳහා අමතර මුද්‍රාවක් (මූඩි ආවරණයක්) වශයෙන් පොලිතීන් හෝ වෙනත් යම් දිරාපත් නොවන ද්‍රව්‍යයක් භාවිත කිරීම,

තහනම් කරනු ලැබේ.

මේ නියමයේ කාර්යය සඳහා-

"දිරාපත් නොවන ද්‍රව්‍ය" යන්නෙන්, ක්ෂුද්‍ර ජීවී ආධාරයෙන් කාබන්ඩයොක්සයිඩ්, මීතේන් හෝ වෙනත් යම් සරල කාබනික අණු බවට වෙන්කරනු ලැබිය හැකි දැව, ලොම්, කපු, සත්ත්ව අපද්‍රව්‍යය හෝ වෙනත් යම් කාබනික ද්‍රව්‍යයකින් සාදා නොමැති යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

"පොලිතීන්" යන්නෙන්, සියලු ආකාරයේ පොලිඑතිලීන්, පොලිප්‍රොපිලීන්, පොලිස්ටයිරීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, පොලිඑතිලීන් ටෙරප්තලේට් හෝ වෙනත් යම් සමාන අමුද්‍රව්‍යයක් අදහස් වේ.

නසීර් අහමඩ්,
පරිසර අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 14 වන දින,
කොළඹ දී ය.

EOG 10 - 0158

1A - PG 6530 — 1506 (2023/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*